# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1480 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 28/11/2023<br>පැය 1720 |

## මාධ්‍ය නිවේදනය

**01.** **ව්‍යාජ ලේඛණ සකස් කිරීම හා ඊට ආධාර අනුබල දුන් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - කෑගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.11.27 වන දින දහවල් කාලයේ කෑගල්ල නගරයේදී කෑගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ව්‍යාජ ලේඛණ සකස් කරනු ලැබූ ස්ථානයක් වටලා එම ලේඛණ සකස් කළ සැකකරුවෙකු සහ ඊට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21, 46 හා 55 වයස්වල පසුවන හකහින්න, හෙට්ටිමුල්ල හා අලපලාවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග ප්‍රථිපල ලේඛණ ව්‍යාජ ලෙස සකස් කර ඇති අතර ව්‍යාජ ලෙස සකස් කළ සහතික පත්‍ර, ඒ සඳහා යොදා ගත් පරිඝණකයක්, ස්කෑනරයක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, සහ පිත්තල මුද්‍රාවක් විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත.

කෑගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02.** **මත්ද්‍රව්‍ය සහ මත්පෙති සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.**

2023.11.27 වන දින දහවල් කාලයේදී දිවුලපිටිය පොලිස් වසමේ නාගහමුල්ල ප්‍රදේශයේදී දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 500 ක්, හෂීස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 ක් සහ මත්පෙති 100 ක් සමඟ සන්තකයේ තබාගෙන** යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරුවන්ගෙන් අනාවරණය වූ තොරතුරු මත එක් සැකකරුවෙකුගේ නිවසේ තිබී තවත් මත්පෙති 10250 ක් සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27 හා 28 වයස්වල පසුවන දෙල්ගොඩ හා හේනේගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.